00097

ශ්‍රී ලංකා විවෘත විශ්වවිද්‍යාලය

මුල් ළමාවිය හා ප්‍රාථමික අධ්‍යාපනය පිළිබඳ
ඩිප්ලෝමා පාඨමාලාව

අවසාන පරීක්ෂණය - 2013

ESD 1135 – පූර්ව ප්‍රාථමික හා ප්‍රාථමික ඉගැන්වීම සඳහා සමෝධානිත ප්‍රවේශය

කාලය - පැය 02යි.

---

දිනය - 2013.02.17 වේලාව - ප.ව. 01.30 - ප.ව.03.30

---

පළමු කොටසේ සියළුම ප්‍රශ්නවලටද, දෙවන කොටසේ ප්‍රශ්න තුනකටද, (03) පමණක් පිළිතුරු සපයන්න.

## I - කොටස

01. සමෝධානිත ඉගෙනුම් - ඉගැන්වීම් ක්‍රියාවලියක දක්නට ලැබෙන විශේෂ ලක්ෂණ හතරක් (04) ලියන්න.

02. ළමයකුගේ කායික සංවර්ධනයට දායක වන චාලක ක්‍රියා පහක් (05) නම් කරන්න.

03. ජෝන් ඩුවී විසින් ඉදිරිපත් කරන ලද ප්‍රාථමික පාසල් ගුරුවරයකු සතු ගති ලක්ෂණ තුනක් (03) කෙටියෙන් විස්තර කරන්න.

04. 1972 අධ්‍යාපන ප්‍රතිසංස්කරණවල ප්‍රධාන අභිප්‍රාය කෙටියෙන් පැහැදිලි කරන්න.

05. 'තේමා ප්‍රවේශය' යනුවෙන් අදහස් වන්නේ කුමක් ද?

06. කුඩා ළමුන් තක්සේරුකරණ ක්‍රම ශිල්ප හතරක් (04) නම් කරන්න.

07. ළමයින්ගේ සංවර්ධනය පිළිබඳ ඇගයීම් වාර්තා පවත්වාගෙන යාමේ වාසි තුනක් (03) කෙටියෙන් පැහැදිලි කරන්න.

08. ස්වයං තක්සේරුකරණය ප්‍රාථමික පාසල් ගුරුවරයාට වලදායි වන ආකාර තුනක් (03) සඳහන් කරන්න.

(ලකුණු 5 x 8 = 40)

## II - කොටස

09. i. 'සමෝධානිත එළඹුම' යනුවෙන් කුමක් අදහස් වේ ද? (ලකුණු 04)

ii. පළමු ශ්‍රේණියේ සිසුන්ට ගැලපෙන සේ සමෝධානිත ඉගෙනුම්-ඉගැන්වීම් ප්‍රවේශය භාවිත කරමින් සකස් කළ පාඩම් සටහනක රූප සටහනක් ඇඳ දක්වන්න. (තේමාව හා අදාළ ක්‍රියාකාරකම් පැහැදිලිව දක්වන්න.) (ලකුණු 10)

iii. ඔබ සංවර්ධනය කළ පාඩම් සටහන පදනම් කර ගනිමින් පාඩම් ක්‍රියාත්මක කිරීමෙන් සිසුන්ට සැලසෙන වාසි තුනක් දක්වන්න. (ලකුණු 06)

10. 'සමෝධානිත ඉගෙනුම් - ඉගැන්වීම් ක්‍රියාවලියේ දී සිසුන් කණ්ඩායම් වැඩවල නිරතවීම කැපී පෙනේ.'

i. මෙම ක්‍රියාවලියේ දී ප්‍රාථමික පාසල් සිසුන් තුළ වර්ධනය වන අංග මොනවාද? (ලකුණු 08)

ii. ප්‍රාථමික පාසල් ගුරුවරයකු ළමයින් කණ්ඩායම වැඩවල නිරත කරවීමේදී අවධානය යොමු කළයුතු කරුණු මොනවා ද? (ලකුණු 12)

11. "පූර්ව ප්‍රාථමික හා ප්‍රාථමික අධ්‍යාපනය සඳහා සාම්ප්‍රදායික ඉගැන්වීමේ ක්‍රමයට වඩා සමෝධානිත ඉගෙනුම් - ඉගැන්වීම් ක්‍රමය වඩාත් සුදුසු වේ."

ඔබ මෙම වගන්තියට එකඟ වේද? ඔබගේ අදහස් උදාහරණ සමඟ දක්වන්න. (ලකුණු 20)

12. i. සේවාස්ථ ගුරු පුහුණු වැඩසටහන් වලින් අපේක්ෂිත අරමුණු මොනවා ද? (ලකුණු 05)

ii. සේවාස්ථ ගුරු පුහුණු වැඩසටහන් මගින් ප්‍රාථමික පාසල් ගුරුවරුන් තුළ වර්ධනය කිරීමට යොමුවන ගුණාංග විස්තර කරන්න. (ලකුණු 15)

13. i. 1972 අධ්‍යාපන ප්‍රතිසංස්කරණ මගින් ප්‍රාථමික අධ්‍යාපන අවධියේ ක්‍රියාත්මක කළ විෂයමාලාව කෙටියෙන් දක්වන්න. (ලකුණු 07)

ii. 1972 අධ්‍යාපන ප්‍රතිසංස්කරණ මගින් හඳුන්වා දෙනු ලැබූ සමෝධානිත විෂයයන් තුන (03) නම් කරන්න. (ලකුණු 03)

iii. සමෝධානිත ඉගෙනුම් - ඉගැන්වීම් ක්‍රියාවලිය ක්‍රියාත්මක කිරීම සඳහා ප්‍රාථමික පාසල් ගුරුවරයා විසින් පන්ති කාමරය සංවිධානය කරගත යුත්තේ කෙසේ ද? (ලකුණු 10)

හිමිකම් ඇවිරිණි.

**THE OPEN UNIVERSITY OF SRI LANKA**

**DIPLOMA IN EARLY CHILDHOOD & PRIMARY EDUCATION – LEVEL 3**

**FINAL EXAMINATIONS – 2013**

**ESD1135 – INTEGRATED APPROACH IN PRE-PRIMARY AND PRIMARY TEACHING**

**DURATION – THREE (03) HOURS.**

| Date: 17th February 2013 | Time: 1.30 p.m. 3.30 p.m. |
|---|---|

Answer all questions in Part I & three (03) questions from Part II.

## PART – I

01. Write four special features of the integrated teaching-learning process.

02. Name five (05) activities that help the physical development of a child.

03. Describe briefly three (03) characteristics of primary school teacher which were forwarded by John Dewey.

04. Briefly explain the major objective of Educational reforms in 1972.

05. What is meant by 'the theme approach'?

06. Name four (04) techniques of assessing young children.

07. Briefly explain the three (03) advantages of maintaining evaluation records on children's development.

08. State three (03) benefits of self assessment for primary school teacher.

(5 x 8 = 40 marks)

## PART II

09. i. What is meant by 'integrated approach'?

(04marks)

ii. Draw a diagram of a lesson plan using the integrated teaching – learning approaches suitable for grade one students.

(10 marks)

iii. State three (03) advantages that the students will gain by implementing the lessons based on the lesson plan developed by you.

(06 marks)

10. "Involvement of children in group activities is prominent in the integrated teaching-learning process."

i. What are the areas which develop in primary school children within this process?

(08 marks)

ii. What are the factors that should be taken into consideration as a primary school teacher when involving children in group activities?

(12 marks)

11. "Integrated Teaching-learning approach is more suitable than traditional teaching method for pre-primary and primary Education" Do you agree with this statement State your views citing examples.

(20 marks)

12. i. What are the objectives of In-service Teacher Training Programmes?

(05 marks)

ii. Describe the qualities which are focused to develop in primary school teachers through in-service teacher training programmes.

(15 marks)

13. i. State briefly the curriculum of the primary Education stage implemented by Educational Reforms in 1972.

(07 marks)

ii. Name the three (03) integrated subjects introduced by Educational Reforms in 1972.

(03 marks)

iii. How does the primary school teacher should organize the classroom to implement the integrated Teaching Learning process.

(10 marks)

*-Copyrights reserved -*